NA - 304

# මුහුදු කළඹ වුණා



NA-304

සුමිත්‍රා රාහුබද්ධ

ජාතික විද්‍යා පදනමෙහි ප්‍රකාශනයකි.

# මුහුද කළු වුණා

## සුමිත්‍රා රාහුබද්ධ



චිත්‍ර නිර්මාණය

**සිබිල් වෙත්තසිංහ**

ප්‍රකාශනය

විද්‍යාව ප්‍රචලිතකරණය පිළිබඳ විශේෂ කමිටුව
ජාතික විද්‍යා පදනම
2005

ජාතික විද්‍යා පදනමෙහි ප්‍රකාශනයකි.

© ජාතික විද්‍යා පදනම

සුමිත්‍රා රාහුබද්ධ

සිත්තම් සිබිල් වෙත්තසිංහගෙන්

පළමුවැනි මුද්‍රණය 2005 අගෝස්තු

**ISBN - 955-590-039-6**

මුහුද කළු වුණා

මුද්‍රණය

**තරංජි ප්‍රින්ට්ස්,**

506, හයිලෙවල් පාර,

නාවින්න - මහරගම.

දුරකථනය - 2804773

පුංචි දුවේ - පුතේ,

මේ කතාව සුනාමි මුහුදු රැළි ගැනයි. සුනාමි ගැන තොරතුරු කතාන්දරයක් සහ සිත්තම් මගින් ඔබ වෙත ගෙන එනවා. අපේ රටට බලපාන ස්වභාවික විපත් ගැන පුංචි ඔබට කියලා දෙන එක අපේ වගකීමක්. මේ කතාවේ එන සිඟිති, සුනාමි මුහුදු රැළිවලට අහුවෙනවා. සුරංගනාවියන් දෙදෙනෙක් ඇයව කැඳවාගෙන ගිහින් සුනාමිය ගැන කියලා දෙනවා.

සිඟිති දැන ගත් ඒ තොරතුරු පුංචි දූලා, පුතාලා හැමෝම දැනගන්න එක හුඟක් වටිනවා. සුනාමි රැළි ආයෙ කවදාවත් අපේ රටටවත්, ලෝකෙ වෙන කිසිම රටකටවත් එන්න එපා. එත් කොයිදේත් දැනගෙන සිටීම හොඳයි නේද?

දුවේ - පුතේ මේ පොත හොඳින් කියවන්න. අපි හැමෝම එකතු වී දැනුවත් වෙමු.

ජාතික විද්‍යා පදනම.

47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 7.
2005 අගෝස්තු

ලොව සියලු දුවා දරුවන්ට

ආදරයෙනි.



සිඟිති සීසී ට සෙල්ලම් කරන්න කතා කළා. සීසී හරි අමුතු වෙලා. කන්දෙක උස්සගෙන, කාමරේ එහාටත් මෙහාටත් පනිනවා.

කන්දක් වගේ කොන්ද උස්සනවා. වෙනදා වගේ නෙවෙයි.

'මොකද ඔයාට වෙලා තියෙන්නෙ අද?'

සිඟිති සීසීව වඩාගෙන ඇහුවා. සීසී 'ඤාව්' කියලා බිමට පැන්නා. කාමරයෙන් පිටතට දිව්වා.

සිගිති ජනේලයෙන් පිටත බැලුවා. සීසී පේන්න නෑ.

'මුහුද හරි ලස්සනයි' සිගිතිට හිතුණා.

තාත්තා බෝට්ටුව පොල් ගහක බඳිනවා. සිගිති තාත්තා දිහා බලාගෙන හිටියා.

සීසී කොහෙද ගියේ?

'සීසී මෙහෙ එන්න පූසී'

සීසී නෑ. සිගිති ගෙයින් එළියට බැස්සා. තාත්තා ළඟට ගියා. අම්මා දුම් දාන තේ කෝප්පයක් අරගෙන තාත්තා ළඟට ආවා. තාත්තා මුහුද දිහා බලාගෙන තේ කෝප්පය අතට ගත්තා.

'මුහුද අද හරි අමුතුයි.' තාත්තා කිව්වා. අම්මයි - සිගිතියි මුහුද දිහා බැලුවා.

'මුහුද ඈතට ගිහින්!' තාත්තා කිව්වා.





'මුහුද හිඳිලා වගේ' අම්මාගෙ ඇස්වල මහ පුදුමයක්.

සිඟිති මුහුද දිහා බැලුවා. ඇයි මුහුද හිඳෙන්නෙ?

අම්මයි, තාත්තායි, සිඟිතියි තුන්දෙනාම මුහුදට ආදරෙයි.

හෝ - හෝ - හෝ ගාන මුහුද!
රළ රැළි නටන දඟලන මහ මුහුද!
සින්දු කියන මහ මුහුද!
තාත්තා මාළු ගේන මහ මුහුද!
ඉර පායන කොට - බහින කොට ලස්සන වෙන මහ මුහුද!

අම්මයි තාත්තයි මුහුද දිහා බලා ඉන්නවා.

'අම්මා සීසී නෑ' සිඟිති කිව්වා.

'සීසී කොහේ හරි ඇති' අම්මා සිඟිතිගෙ හිස පිරිමදිමින් කිව්වා.

තාත්තගෙ හිතේ කලබලයක්. ඇස්ලොකුයි. මූණ අඳුරුයි.

මුහුද හිඳිලද? තාත්තට දුක හිතිලද?

ලොකු බඩක් තියෙන ලොකු සතෙක් ඇවිල්ලා මුහුදු වතුර බීලද?

මුහුද හරි අමුතුයි. තාත්තා සිඟිතිගෙ අතින් අල්ලගෙන අම්මට කිව්වා.

අම්මට උත්තර දෙන්නවත්, හූම් කියන්නවත් බැරි වුණා.





හිටපු ගමන් මුහුද රැළි මාලාවක් උසට උසේ, උඩ පනිමින්, පෙරලෙමින් ගොඩට එනවා.

සිඟිති අම්මව බදා ගත්තා.


හෝ හෝ හෝ හඬ නෙවෙයි ඇහෙන්නෙ.

පෙරළිලා, පෙරළිලා එන මහා හඬක්.

මිනිස්සු කෑගහගෙන, පෙරළීගෙන එන මුහුදු රැළි අතරින් ගොඩ පැත්තට දුවනවා. දුවනවා. දුවනවා.

තාත්තා සිඟිතිව වඩා ගත්තා. ගොඩට දුවනවා හැමෝම.

දුවලා - දුවලා - උස තැනකට ගියා. තව දුවන්න බෑ.



හැමෝම නැවතිලා බලා හිටියා.

හැම තැනම මුහුදට බය වුණු මිනිස්සු!

ටික වෙලාවකට පස්සෙ, දුවගෙන ආපු මුහුදු රැළි ආපහු හැරිලා යනවා. හෙමින් හෙමින්.

හරියට හති වැටිලා වගේ. අම්මලා - තාත්තලා, අයියලා - අක්කලා, නැන්දලා - මාමලා දැන් මුහුද දිහාවට යනවා.

මුහුදු වෙරළට පාවෙලා ඇවිත් නොයෙක් නොයෙක් ජාති.

හැමෝම ඒවා අහුලනවා. බලනවා.

කතා කරනවා වෙච්ච දේ ගැන.

මුහුද ගොඩ ගලලලු!

'අනේ කෝ සීසී'

'සීසී - මෙහෙ එන්න පූසී'

'මුහුද ගොඩ ගැලුවා වගේ' තාත්තා කිව්වා.

මෙහෙම දෙයක් දැක්කමයි කියලා මාමා කෙනෙක් කිව්වා.

හැමෝම වෙරළෙ වෙච්ච දේ ගැන කතා කරනවා.

සිඟිති දැක්කා තුසරත් සිප්පි කටු ඇහිදිනවා.

ලොකු ලොකු සිප්පි කටු. සිඟිති, සිප්පි කටුවක් අහුලන තුසරට කතා කළා.




එච්චරයි.

ඇසිල්ලකින් මහා උස රැළි කන්දක් පිඹගෙන, පිඹගෙන කෑ ගහගෙන මහ වේගයෙන් ගොඩබිමට ආවා. මහා උසට මහා වේගයෙන්.

සිගිතිට එච්චරයි මතක.





සිඟිති ගහගෙන ගියා. වතුර පෙවුණා.

ගහගෙන - ගහගෙන - ගහගෙන ගියා.

ලී කොටවල, ගස්වල, කණුවල හැපුණා. පැටලුණා. පාවුණා.

මැරෙයි - මැරෙයි - මැරෙයි කියලා සිඟිතිට හිතුණා.

මහ මුහුදම කඳුළු වුණා. සිඟිතිට ඇඬුණා.

අම්මා තාත්තා මැරෙයි. මුහුද නපුරුම නපුරුයි.

හැමෝම මැරෙයි කියලා සිඟිති හිතුවා. ඇඬුවට කාටද ඇහෙන්නෙ?

එක පාරටම මහා එළියක් සිඟිති ළඟට ආවා.

ඒ එළියත් එක්ක ආවේ සුරංගනාවි. කරුණාවෙන් පිරිච්ච මූණක්.

ලස්සන හිනාවක්. සුරංගනාවි ආදරයෙන්, සිඟිතිව වඩා ගත්තා.

'මගේ නම සුරංගනාවි' ඈ කිව්වෙ සිඟිතිට හාද්දක් දෙමින්.





'කෝ මගේ අම්මා - කෝ මගේ තාත්තා' සිඟිති අමාරුවෙන් හුස්ම ගනිමින් ඇහුවා. සුරංගනාවි සිඟිතිව උස් තැනකට කැඳවාගෙන ගියා. සිඟිතිව උණුසුම් කළා.

සුරංගනා ලොවින් ගෙනා සේලයකින් සිඟිතිගෙ තෙත සිරුර පිස දැමුවා. ලස්සන ඇඳුමක් සිඟිතිට ඇන්දෙව්වා. සිඟිතිට රස කිරි වීදුරුවක් දුන්නා. සිඟිති කිරි වීදුරුව බිව්වා. ඒත් ඇස්වල කඳුළු පිරිලා.



'අම්මා තාත්තා - සීසී' සිඟිති සුරංගනාවි දිහා බලලා මිමිණුවා. ඒ එක්කම එළියක් ආවා. ඒ එළියත් එක්ක තව සුරංගනාවියක් ආවා. ඒ සුරංගනාවි තුසරව එක්කරගෙන ඇවිත්. තුසර හොඳටම බයවෙලා. සුරංගනාවියො දෙන්නම එකතු වෙලා තුසරව උණුසුම් කළා. තුසරට ආදරයෙන් කතා කළා. තුසරට උණුසුම් ඇඳුම් ඇන්දෙව්වා.

තුසරයි - සිඟිතියි අත් අල්ලා ගත්තා.

'තුසරයි - සිඟිතියි යාලුවොද?' සුරංගනාවි ඇහුවා.

තුසරයි - සිඟිතියි ඔව් - ඔව් කිව්වා.

'අම්මලා කෝ?' දෙන්නගෙම ප්‍රශ්නය එකයි.

'අපි අම්මලා හොයමු.' සුරංගනාවියො කිව්වා.

'ඔයාලා සුරංගනා නැන්දලාද?' සිඟිතිගෙ ප්‍රශ්නයට සුරංගනාවියො ආදරයෙන් සිනාසුණා.

'ඔව් අපි සුරංගනා නැන්දලා.'

'අපි දෙන්නව බේරා ගත්තාට පින්.'

'ඔයාලා දන්නවාද මොකද වුණේ කියලා'

'මුහුද ගොඩ ගැලුවා නේද?' සිඟිති ඇහුවා.

'ඔව් මුහුද ගොඩ ගැලුවා.'

'අපිට කියලා දෙන්න සුරංගනා නැන්දා.'

'මුහුද ගැලුව හැටි කියලා දෙන්නම්.' සුරංගනාවි, සිඟිතිටයි තුසරටයි කිව්වා.

සිඟිතිට කතාව අහන්න ආසයි.

ඒත් සිඟිතිට අම්මයි තාත්තයි මතක් වුණා.

සිඟිතිට හරි දුකයි.

'සිඟිතියි - තුසරයි තව ලොකු වෙනවා. මහ මුහුදට මොකද වුණේ කියලා දැන ගන්න එක හොඳයි නේද?' සුරංගනාවි ඇහුවා. සිඟිතියි, තුසරයි ඔව් කිව්වා.

'මුහුදට පතුලක් තියෙනවා. මුහුදු පතුල දෙදරලා. හුඟාක් ඈත මුහුදු පතුලක් දෙදරලා.' සුරංගනාවි කිව්වා. සිඟිති පුදුම වෙලා බලාගෙන ඉන්නවා.


'සිඟිතිට තේරුණේ නැද්ද?'

'නෑ' සිඟිතියි, තුසරයි දෙන්නා උත්තර දුන්නා.

මුහුදු පතුල පුපුරලා. සිඟිති ඇස් ලොකු කරලා බලා ගෙන හිටියා. තුසර බය වෙලා.

මුහුදු පතුල පිපිරුණාම මුහුදු රළ ඉහළ නගිනවා. හරි සැරයි.





මහා භයානක මුහුදු රැළි.

ලෝකයේ තියෙන භයානකම විපත් වලින් එකක් තමයි මේ මුහුදු රැළි.

මේ මුහුදු රැළි වලට කියනවා සුනාමි (tsunami) කියලා. ඉංග්‍රීසියෙන් කියන්නේ harbour waves කියලා. සුනාමි කියන්නෙ ජපන් වචනයක්.

'සුනාමි කියන්නෙ මොකක්ද සුරංගනා නැන්දා' තුසර ඇහුවා.

'Tsu කියන්නෙ වාරාය. nami කියන්නෙ රැළි.' සුරංගනාවි කියලා දුන්නා.

'සුනාමියට පුළුවන් ගෙවල් කඩන්න. මිනිස්සු ගිලින්න.' එහෙම කිව්වාම සිඟිතිගේත්, තුසරගේත් ඇස්වල කඳුලු පිරුණා. ඒත් සුනාමි ගැන දැන ගන්නත් ආසයි.

සුනාමියට පුළුවන් පැයට කිලෝමීටර් සිය ගණන් වේගයෙන් එන්න.





'සුනාමි රැළි හුඟක් උසයි. අපේ ගේ යට වුණා. තට්ටු දෙකක ගේ.' තුසර කිව්වේ සිඟිතිගේ අතින් අල්ලාගෙන.

'ඔව් තුසර සුනාමි රැළිවලට පොල් ගහකටත් වඩා උසට යන්න පුළුවන්. මීටර් තිහකට වඩා උසට යන්න පුළුවන්. ඒකනෙ තුසර ගෙවල් කඩාගෙන ගියේ.?


තුසරයි - සිඟිතියි අතින් අත අල්ලා ගත්තා.

'සුනාමි රැළි හැදෙන්නේ මුහුදු පතුල පිපිරුණාම විතරද?' සුරංගනාවි ළඟ දණගසා ඉඳගෙන සිඟිති ඇහුවා.

'නෑ සිඟිති මුහුදු පතුලේ භූමි කම්පා, ගිනි කඳු පිපිරීම, නාය යෑම වගේ දේවලිනුත් සුනාමි ඇති වෙනවා.'

'ඒවා ගැන මම පස්සෙ කියලා දෙන්නම්.' සුරංගනාවි සිඟිතිටත්, තුසරටත් හාදු දෙකක් දෙමින් කියා සිටියා.

'මෙන්න බලන්න.' දෙවැනි සුරංගනාවි පින්තූරයක් පෙන්නුවා.



'ගහකොළ, ගෙවල් දොරවල්, මිනිස්සු, සුනාමියට අහුවෙලා.'

සිඟිතියි - තුසරයි කඳුලු පිරුනු ඇස් වලින් පින්තූර දිහා බලා හිටියා.

'සුනාමි හරි නපුරුයි. ගොඩ ඇවිත් පුංචි ළමයින්වත් මුහුදට ඇද ගෙන යනවා.' පළවැනි සුරංගනාවි කියන කොට සිඟිති ප්‍රශ්නයක් ඇහුවා.

'ආයෙ සුනාමියක් එයිද සුරංගනාවි නැන්දා?' තුසර ඇහුවේ හරි බයෙන්.



සුරංගනාවියො දෙන්නා සිගිතිවයි, තුසරවයි තුරුල්ලට ගත්තා. ඔවුන්ව සිප ගත්තා.

'මුහුදු පතුලේ ඇතිවෙන විශාල භූමි කම්පාවලට පස්සෙ සුනාමියක් එන්න පුළුවන්. විශාල භූමිකම්පා අපට දැනෙනවා. හරියට පොළව හෙලවෙනවා වගේ.'

'සිගිති මොනවද කරන්නෙ එහෙම වුනොත්?' සුරංගනාවි ඇහුවා.


'අම්මා ළඟට දුවනවා.' සිගිති හෙමින් කිව්වා.

'ඒත් කෝ අපේ අම්මා.' සිගිතිට දුක හිතුණා.

'අම්මා ළඟට දුවන එක හොඳයි. අම්මා ළඟට දුවලා අම්මට කියන්න උස් තැනකට ඔයාව ගෙනියන්න කියලා. පුළුවන් තරම් ඉක්මනට.' පළමු සුරංගනාවි අවවාද කළා.

'සමහර වෙලාවට මුහුදෙ වතුර හිඳිලා ගිහින් වගේ පේන්න පුළුවන්. ඒක හොඳ ලකුණක් නොවෙයි. මුහුදෙ වතුර හිඳිලා වගේ දැක්කොත් ඔයා මොකද කරන්නෙ?' සුරංගනාවි තුසරගෙන් ඇහුවා.

'මාත් එහෙම දැක්කා. අපි ඒක බලන්න මුහුදු වෙරළට ගියා.' තුසර කිව්වා.





'මුහුද හිඳිලා වගේ ආයෙම දැක්කොත් මුහුදු වෙරළට යන්නෙ නෑ නේද? දන්නවා නේද තුසර ඒක අනතුරුදායකයි කියලා?' සුරංගනාවි තුසරගෙ හිස අතගාමින් ඇහුවා.

'ඔව්! මං ආයෙ මුහුද හිඳිලා වගේ දැක්කොත් දුවලා දුවලා උඩහට යනවා. උසම තැනකට යනවා.' තුසර කිව්වා. තුසරගෙ කඳුළු සුරංගනාවිගෙ අතට වැටුණා.

'තව?' සිඟිති, දෙවැනි සුරංගනාවිට තවත් තුරුලු වෙමින් ඇහුවා.

'හරියට කෝච්චියක් එනවා වගේ එහෙම නැතනම් ජෙට් එකක් එනවා වගේ මහා සද්දෙන් මුහුදු රළ ගොඩ ගලන්න පුළුවන්. එහෙම සද්දෙන්



රළ ගොඩ ගැලුවොත් පුළුවන් තරම් ඉක්මනට රට ඇතුලට යන්න ඕනෑ. උස් තැනකට යන්න ඕනෑ.' පළමු සුරංගනාවි විස්තර කරලා දුන්නා.


'හරියට හරි. එහෙම වුණාම සිඟිති ගොඩ බිමට දුවන්න ඕන.'



‘ඒවගේම කටින් කට ආරංචි වෙන්න පුළුවන් සුනාමි ගැන.’

‘ගුවන් විදුලියෙන් - රූපවාහිනියෙන්, කාලගුණ වාර්තා වලින්. සුනාමි ගැන කියන්න පුළුවන්.’

‘ඒවාට හොඳට ඇහුම්කන් දෙන්න ඕන.’ දෙවැනි සුරංගනාවිගෙ කතාවට සිඟිති හොඳින් කන් දුන්නා.




සිඟිතිට කල්පනා වුණා පළවැනි රැල්ලයි - දෙවැනි රැල්ලයි.

'එක රැල්ලක් ඇවිල්ලා ගියාම මුහුද බලන්න යන්න හොඳ නැහැ නේද සුරංගනාවි නැන්දා?' සිඟිති ඇහුවා.

'ඇත්ත තමයි. සුනාමිය අරන් එන්නෙ එක රැල්ලක් නොවෙයි. තව රැළි ගොඩක් අරන් එන්න පුළුවන්. ඒවා පළවැනි රළට වඩා සැරයි. උසයි. නපුරුයි.'

'සුනාමිය නපුරුයි. හරිම නපුරුයි. මගේ අම්මා කෝ? සීසී කෝ? තාත්තා කෝ?' සිඟිති අඬන්න පටන් ගත්තා.

'අපි හොයමු. අම්මාව හොයමු. තාත්තාව හොයමු. සීසී හොයමු.'



'දැන් අපි ගුවන් විදුලිය මොනවද කියන්නෙ කියලා අහමු. ගුවන් විදුලියෙන් ආරක්ෂාව නැති තැන්, කැඩිච්ච පාලම් ගැන කියයි.' පළමු සුරංගනාවි කිව්වා.

'අපේ අම්මලා මුහුදට ඇදගෙන ගිහින්ද?' තුසර කඳුලු පුරවගෙන ඇහුවා.

'හුඟක් අම්මලා, තාත්තලා වගේම නැන්දලා, මාමලා, නංගිලා, මල්ලිලා, අයියලා, අක්කලා මුහුදට ගහගෙන යන්නත් ඉඩ තියෙනවා. අපි ඒ ඔක්කොටම උදව් වෙන්න ඕනෑ.'

සුරංගනාවියො දෙන්නයි - සිඟිතියි - තුසරයි සුනාමිය ගැන ගොඩක් දේවල් කතා කළා.

'සුනාමිය කියන්නෙ මොකක්ද කියලා දැන් සිඟිති කියන්න මට.' පළවැනි සුරංගනාවි සිඟිතිට කිව්වා.

සිඟිතියි, තුසරයි උත්තර දෙන්න පටන් ගත්තා.

'සුනාමි කියන්නෙ ගොඩබිමට මහා විනාශයක් ඇති කරන්න පුළුවන් මුහුදු රළ වලට. සුනාමි රළ හරි විශාලයි. මිනිස්සුන්ව මුහුදට ඇදගෙන යනවා. ගෙවල් කඩනවා. වෙරළ ළඟින් යන කෝච්චි පෙරළනවා. කාර්, බස් බෝට්ටු මුහුදට අරගෙන යනවා.'





'සුනාමියක් එනවා කියලා දැනගන්නේ කොහොමද?' සුරංගනාවිගෙන් ප්‍රශ්න ගොඩයි.

'සුනාමියක් එනවා කියලා අපට අනතුරු අඟවන්නෙ සාගරයෙ, මහ මුහුදෙ අමුතු අමුතු ශබ්ද, වෙනස්කම්' තුසර කිව්වා.

'සුනාමියක් ආවොත් මොකද අපි කරන්න ඕනෑ' සුරංගනාවිගෙන් තව ප්‍රශ්නයක්.

'කවදාවත් සුනාමියක් එන හැටි බලන්න වෙරළෙ ඉන්න හොඳ නෑ.'

'මුහුදු වෙරළෙයි, වෙරළබඩ පළාත්වලයි සිද්ද වෙන දේවල් ගැන හොඳ කල්පනාවෙන් ඉන්න ඕනෑ.'

'සුනාමියක් එනවා කියලා දැනුනොත් උස් තැනකට ඉක්මනට යන්න ඕනෑ.'

'සීසී බේරෙන්න ඇති.' සිඟිති තුසරට කිව්වා.

'ඔව් සිඟිති සත්තුන්ට පරිසරයේ වෙනස්කම් කල්තියා දැනෙනවා.' සුරංගනාවි පැහැදිලි කළා.

'අපි අම්මලා - තාත්තලා හොයමු' සුරංගනාවියන්, සිඟිතිවයි - තුසරවයි සිප ගනිමින් කිව්වා.

'මගෙ සීසී'



"සීසී ඔයාව හොයාගෙන එයි." සුරංගනාවි කිව්වා.

සිඟිතිවයි - තුසරවයි අතින් අල්ලාගෙන සුරංගනාවියො ඔන්න දැන් යන්නෙ සීසීවයි, අම්මලා - තාත්තලාවයි හොයන්න.

